**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2021**

**-----------------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය.**

**--------------------------------**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 10 කින් සමන්විත බුත්තල ගොවිපොළ භූමියේ සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 1,451,198 ක් වැයකර නළ ළිඳක් සකස් කිරීම, අලි වැට අලුත්වැඩියාව, කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම වැනි ඉඩම් සංවර්ධන කටයුතු සහ අක්කර 16 කින් සමන්විත තණමල්විල ගොවිපොළ භූමියේ සුළු වාරි වැව ප්‍රතිසංස්කරණය කරවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 500,000 ක අත්තිකාරමක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවා සිදු කර තිබුණු නමුත් එම ඉඩම්වල අයිතිය මණ්ඩලය වෙත පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරාගෙන නොමැති බව සටහනක් මගින් හෙළිදරව් කර නොමැති බව පිළිගනිමි. එය ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරමි. එසේම මෙම ඉඩම දීර්ඝකාලීන බදු මත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර එය අවසන් අදියරේ ඇත. | නොපමාව ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.**

**1.6.1 ලැබිය යුතු මුදල්.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු. 691,211ක වසර 08 කට වඩා පැරණි රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ පුද්ගලයන්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂයන් පැවති අතර එම ණයගැති ලේඛනයේ සඳහන් ඇතැම් ණයගැතියන් ව්‍යාජ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මු.රෙ. පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය පත් කළ නිලධාරියා විසින් මූල්‍ය කටයුතු පිළිබඳව දැනුමක් ඇති නිලධාරියෙකුගේ සහය අවශ්‍ය බව ප්‍රකාශ කර ඇත. ඒ වෙනුවෙන් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ලිපියක් යවා ඇත. | නොපමාව ණයගැති ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට රු. 3,185,489ක් වූ ලැබිය යුතු ශේෂයෙන් රු. 512,381ක් වර්ෂ 02කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරාජ් ප්‍රියශාන්ත මලවිආරච්චිගේ ණය අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. සහල් ව්‍යාපෘතියෙන් අය වීමට ඇති රු. 67,282 ක මුදල මෙය ආයතන තුළම භාණ්ඩ හුවමාරු වීමක් ලෙස හඳුනාගෙන ඇති අතර එය මෙතෙක් අයවී නොමැත. අනෙකුත් ණය අය කරගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි යවා ඇත. | නොපමාව මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 104 | 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ සිදු වූ රු. 4,094,596 ක වටිනාකමැති සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 37,223 ක් අස්ථානගත වීම සම්බන්ධ පරීක්ෂණ සිදු කර අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ 104 පරීක්ෂණය අනුව වගකිව යුතු පාර්ශව වලට අදාළ මුදල වන රු. 4,094,596 ක මුදල ගෙවන ලෙසද දන්වා ඇත. | වගකිව යුතු පාර්ශවවලින් අලාභය අය කරගත යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ. 371 (2) | කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 06 දෙනෙකුට ගමන් වියදම්, විවිධ මිලදී ගැනීම් සහ සංග්‍රහ වියදම් සඳහා ලබාදුන් රු. 660,400 ක අත්තිකාරම් 24 ක් පියවීම සඳහා දින 07 සිට දින 199 දක්වා කාලයක් ගත කර තිබුණි. | කොවිඩ් - 19 වසංගතය තත්වය හේතුවෙන් මණ්ඩලය වසා තිබීම නිසා අත්තිකාරම් කිහිපයක් අදාළ කාලසීමාව තුළ පියවීමට නොහැකි වූ බව පිළිගනිමි. ඉදිරියේ දී එසේ නොවීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අත්තිකාරම් පියවිය යුතුය. |
| (ඇ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මණ්ඩලයේ 2021 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ අදාළ වර්ෂයට යාවත්කාලීන කළ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය හා දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය, ප්‍රධාන ප්‍රසම්පාදනයන් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ලබාදුන් ආකෘතියට අනුව ක්‍රියාත්මක සැලැස්ම සකස් කර ඇත. ඉදිරියේදී විගණනය මගින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,828,645 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු. 12,505,208 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,333,853 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන රු. 11,279,307 කින් අඩු වීම වෙනත් මෙහෙයුම් ආදායම රු. 4,352,757 කින් අඩුවීම, පොලී ආදායම රු. 3,604,784 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර / අමාත්‍යාංශ ප්‍රදාන, වෙනත් මෙහෙයුම් ආදායම්, පොලී ආදායම් හා වෙනත් ආදායම් පිළිවෙළින් සියයට 23, 52, 24 හා 58 ක් අඩු වී තිබුණි. එසේම සේවක පරිශ්‍රමික වියදම සැපයුම් හා අවශ්‍යතා වියදම් හා ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් වියදම් හා ස්ථාවර වත්කම් අලුත්වැඩියා නඩත්තු වියදම් පිළිවෙළින් සියයට 09, 11, 03 හා 10 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු සිදු කර තිබුණි.පස් ඉවත් කිරීම වෙනුවෙන් රු. 3,370,595 ක වියදමක් දරා තිබුණු අතර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු. 81,134,631 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින්මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු. 77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | මණ්ඩලයේ පනතට අනුව මණ්ඩලයේ පොදු අරමුණු අංක 02 අනුව මණ්ඩලයේ බලතල යටතේ අංක 04 හි මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීම පිණිස මෙම සංවර්ධන කටයුත්ත 2017/2018 යන වර්ෂ වලදී මණ්ඩලය විසින් සිදුකර ඇත. මෙම ව්‍යාපෘතියෙන් උපයාගත් මුදල අමාත්‍යාංශය විසින් ලබාදෙන උපදෙස් මත අදාළ ගොවි සංවිධාන වලට ප්‍රතිලාබ ලැබෙන සේ සංවර්ධන කටයුත්තක් සඳහා යෙදවීමට සැලසුම් කරන තෙක් මෙම මුදල් කිසිඳු කාර්යයක් සඳහා නොයෙදවන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා වාචික උපදෙස් දී ඇත. ඒ අනුව මෙසේ ස්ථිර තැන්පතුවක් තුළ රඳවාගෙන ඇත. | මණ්ඩලයේ පනතට අනුව කාර්යයන් සිදු කළ යුතුය. ස්ථාවර තැන්පතුවල ඇති මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තණමල්විල ගොවිපොළෙහි පොදු කාර්යය පිරිවැයෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රතිශතයක් වැටුප් හා වේතන සඳහා වැය කර තිබුණු අතර ආදායම අඩුවීම හේතුවෙන් 2017 සිට 2021 වර්ෂය දක්වාම ශුද්ධ අලාභයක් ලබා තිබුණි. 2021 වර්ෂයේ කිසිඳු ආදායමක් ලබාගෙන නොතිබීම නිසා ශුද්ධ අලාභය රු. 874,826 ක් වී තිබුණි. | ඉදිරියේදී ස්ථිරසාර සංවර්ධන කටයුත්තකට මෙම ගොවිපොළ යොමුකිරීමට සැලසුම්කර ඇත. මේ සඳහා යොදවා ඇති සේවක මහතුන් දෙදෙනාගේ වැටුප් වෙනුවෙන් වැයකර තිබූ මුදල මෙම ව්‍යාපෘතියේ ශුද්ධ අලාභය ලෙස පෙන්නුම් කරයි. | ලාභ ලැබිය හැකිවන පරිදි ගොවිපොළ කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු පැළ තවාන්, සාම්ප්‍රදායික සහල් අලෙවි ව්‍යාපෘතිය හා ගොවිපොළවල් වැනි ව්‍යාපෘති 08 කින් ව්‍යාපෘති 05ක් ශුද්ධ අලාභයන් ලබා තිබුණු අතර එම ව්‍යාපෘති 05 හි ශුද්ධ අලාභය රු. 8,400,212 ක් විය. | අප මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාලවල පවත්වාගෙන යනු ලැබූ ව්‍යාපෘතීන් බොහොමයක් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවීය. දෙහිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් අලෙවිසැල, නාරාහේන්පිට පැළ හා කෘෂි යෙදවුම් | මණ්ඩලය විසින් ලාභ ලැබෙන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අලෙව්සැල, තණමල්විල ගොවිපල, පාරම්පරික සහල් ව්‍යාපෘතිය හා කලංකුට්ටිය කර්මාන්තශාලාව යනාදී කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවුණද එම ව්‍යාපෘතිවලට අනුයුක්ත සේවකයින්ට වැටුප් හා පරිපාලන වියදම් පමණක් ගෙවා ඇති බැවින් සියලු ව්‍යාපෘති ශුද්ධ අලාභයක් පෙන්නුම් කරයි. | |
| (ඈ) | ඉකුත් වර්ෂ 04 දී ලාභයක් ලබා තිබුණු මණ්ඩලය සමාලෝචිත රු. 3,828,645ක ශුද්ධ අලාභයක් ලබාගෙන තිබුණි. මණ්ඩලය සිදුකරන ව්‍යාපෘති බොහෝමයක අවම කාර්යසාධනයක් පැවතීම සමස්ත මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපා ඇති බව නිරීක්ෂණය විය. | අප ආයතනය විසින් ආදායම් උත්පාදනය කරමින් සිදුකල ඇතැම් ව්‍යාපෘතීන් විගණනය විසින්ම අප ආයතනයට අදාළ නොවන ව්‍යාපෘතීන් බව පෙන්වාදීම මත එවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහල කලමණාකාරීත්වය විසින් සිදුකරන පෙලඹවීම් අඩුවීම මෙම තත්ත්වය සඳහා බෙහෙවින් බලපා ඇත. උදා 1- බඩඉරිඟු ආනයනය, උදා 2- වැව් ව්‍යාපෘති.<br>නමුත් මෙවැනි ව්‍යාපෘති තුළින් අප ආයතනය විශාල ලාභයක් උත්පාදනය කරමින් ප්‍රතිලාභීන්ටද මහඟු සේවාවක් ඉටු කළේය. එම නිසා ඉදිරියේදී ඉහල කලමණාකාරීත්වය සමඟ සාකච්ඡා කර ආදායම් උත්පාදනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමු. | අලාභ ලබන ව්‍යාපෘති ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2019 සිට 2021 වර්ෂ 03 කාල සීමාව තුළදී මණ්ඩලය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුව ආහාර තාක්ෂණ ඒකකය මගින් සිදුකළ මව්පෝෂ ව්‍යාපෘතිය, සුවපෝෂ ව්‍යාපෘතිය, තෝසේ පිටි නිෂ්පාදන ව්‍යාපෘතිය, සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය, පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති සියල්ලම යන්ත්‍ර අක්‍රිය වීම හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු නිසා නතර කර තිබුණි. | පෙන්වා දී ඇති තත්ත්වය සැබෑ වන අතර නැවත මෙම ව්‍යාපෘතීන් පණගැන්වීම සඳහා ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකය සමඟ කටයුතු කරමින් පවතී. | අක්‍රීය ව්‍යාපෘති සක්‍රීයව පවත්වාගෙන යාමට ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015, 2016, 2017, 2018, 2019, 2020 හා 2021 වර්ෂවල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2015/2016 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. 2017 වාර්ෂික වාර්තාව සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. 2018 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට යොමුකිරීම සඳහා මුද්‍රණය කරමින් පවතී. 2019/2020 වාර්ෂික වාර්තාවල පරිවර්තන කටයුතු සිදුකරමින් පවතී. | නොපමාව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය |